# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,576 - 2008 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා - 2008.11.14

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1400 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1400 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 1401 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1410 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 නොවැම්බර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 නොවැම්බර් මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 608

DRF/21/RECT/2649.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2008 ජනවාරි මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බළ හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) දලවැල්ලෙ හේවාගේ සුමනසේන, යූඑස්පී ඉසේබ (නි/61581)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

11-264

2008 අංක 609

DIRF/RECT/220/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බළ හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

2006 ජූලි මස 07 වැනි දින අංක 1,453 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 2006 අංක 140 මගින් ප්‍රකාශයට පත් කරන ලද අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන්වරුන් වශයෙන් අධිකාරියට පත්කරනු ලැබූ කෙඩෙට් නිලධාරී ලේඛනයේ අනු අංක 01හි නම සඳහන් කෙඩෙට් නිලධාරී රත්නායක මුදියන්සේලාගේ එරංග ඉන්දික රත්නායක යන නිලධාරීට ඉහළින් පහත නම සඳහන් කෙඩෙට් නිලධාරී 2005.12.17 වැනි දින සිට දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත්කිරීම සහ එම දින සිට ඔහුගේ නම ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තුව වෙත ඇතුලත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/56407 කෙඩෙට් නිලධාරී හෙට්ටිතන්ත්‍රිගේ දොන් මෙන්ඩක හෙට්ටිතන්ත්‍රි - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

11-263

# ආණ්ඩුවේ නිවේදන

මගේ යොමු අංකය : ඊ. ඩී. /1/8/1/මහ/78.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 1 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ), (ආ) (ඇ) (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය, වැලිගල්ලේ පිහිටි මහ/විදුමිණ මූලික පිරිවෙන 2008.01.02 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය මාරතුගොඩ ධම්මානන්ද ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම් පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2008 ඔක්තෝබර් මස 20 දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපායේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

11-148

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

**වාර්ෂික ගිණුම් 2006**

2. **කළමණාකරණ මණ්ඩලයේ සමාලෝචනය**

2.1 *අරමුණ* :

අරමුදලේ අරමුණ හා පරමාර්ථය වනුයේ විශ්‍රාම වැටුප් රහිත මාසික වැටුප් ලබන රාජ්‍ය සේවකයින් සඳහා අර්ථසාධක ක්‍රමයක් ඇති කිරීමයි. 2003.01.01 දින සිට විශ්‍රාම වැටුප් නොලබන හා කිසිදු සමාජ ආරක්ෂණයක් නොමැති සියලුම රාජ්‍ය සේවකයින් සඳහා මෙම අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීම ව්‍යාප්ත කර ඇත.

22 *කාර්යයන්* :

අරමුදලේ ප්‍රධාන කාර්යයන් වනුයේ

(අ) රජයේ විවිධ දෙපාර්තමේන්තු හා විදේශ තනාපති කාර්යාලවල සේවය කරන විශ්‍රාම වැටුප් අහිමි මාසික වැටුප් ලබන රාජ්‍ය සේවකයින්ගේ මාසික වැටුපෙන් 8% දායක මුදලක් අයකර අරමුදලට බැර කිරීම.

(ආ) එම අයකරනු ලබන මුදල් පිළිබඳ වාර්තා ගෙන්වා ගැනීම, එම තොරතුරු සටහන් කර තැබීම හා දායක මුදල් නිසි පරිදි අරමුදලට බැර කිරීම.

(ඇ) එක් එක් වර්ෂයක් අවසානයේ දායකයින්ගේ ගිණුම් වල ඇති ශේෂයන් ඔවුන් වෙත දැන්වීම හා ඔවුන්ගේ දායකත්වය අවසන් වූ වහාම ඔවුන්ට හිමි ප්‍රතිලාභයන් කඩිනමින් ලබාදීම.

(ඈ) අරමුදලට එකතුවන හා අතිරික්ත වන මුදල් දායකයින්ට වැඩි පොලියක් ගෙවිය හැකිවන පරිදි රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හා වර්ෂය අවසානයේදී දායකයින්ගේ ගිණුම්වලට පොලී විසර්ජනය කිරීම

2.3 *කාර්ය සාධනය*

(අ) *මූල්‍ය මෙහෙයුම* :

සමාලෝචිත වර්ෂය තුළ අරමුදලට ලැබුණු අනිවාර්ය දායකය හා රජයේ දායකය පිළිවෙලින් රු. 451,163,080 ක් හා රු. 247,236,162 ක් වූ අතර 2005 වර්ෂය තුළ එය පිළිවෙලින් රු. 496,376,529 ක් හා රු. 251,182,617 ක් විය. අරමුදලේ මූල්‍ය සම්පත් ආයෝජනය කිරීමෙන් වර්ෂය තුළ ඉපයූ මුලු ආදායම රු. 1,055,849,281 ක් වූ අතර පසුගිය වර්ෂයේ මෙය රු. 964,208,783 කි. අරමුදල මෙහෙයවීම සඳහා දැරූ පරිපාලන වියදම රු. 543,632 ක් අඩු කිරීමෙන් පසු වියදම ඉක්ම වූ ආදායම රු. 1,049,305,649 ක් වූයෙන් දායකයින් සඳහා ගෙවිය හැකි වූ පොලී ප්‍රතිශතය 8.04% ක් විය. පසුගිය වර්ෂයේ මෙය 9.00% කි. ආසන්න කාර්තු ප්‍රතිශතය වූ 8.04% ක් එනම් රු. 1,048,661,014 ක මුදලක් විසර්ජනය කිරීමෙන් පසු රු. 644,635 ක අතිරික්තයක් ඇති වූ අතර එය පොදු සංචිත ගිණුමට මාරු කරන ලදී.

(ආ) *ප්‍රගතිය*

i. අරමුදල් ආපසු ගෙවීම්

| | | |
|---|---|---|
| 2006 වර්ෂය තුළ ලැබුණු ඉල්ලුම්පත් ප්‍රමාණය | - | 1103 |
| අනුමත කරන ලද ආපසු ගෙවීම් ප්‍රමාණය | - | 622 |

එක් එක් වගන්තිය යටතේ කරන ලද ගෙවීම්

| | | |
|---|---|---|
| 20 වගන්තිය | - | 286 |
| 14 වගන්තිය | - | 280 |
| 16 වගන්තිය | - | 50 |
| සදොස් ගෙවීම් | - | 06 |
| එකතුව | - | 622 |

ii. සාමාජිකත්වය පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| 2006.01.01 දිනට සාමාජික සංඛ්‍යාව | - | 197,951 |
| වර්ෂය තුළ ලියාපදිංචි වූ සංඛ්‍යාව | - | 10,683 |

| | | |
|---|---|---|
| කරන ලද ප්‍රදානයන් සංඛ්‍යාව | - | 622 |
| 2006.12.31 දිනට සාමාජික සංඛ්‍යාව | - | 208,012 |

2.4 *ගිණුම් ප්‍රතිපත්ති :*

(*අ*) ගිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළිගත් ගණකාධිකරණ සම්මත මූලධර්මවලට අනුව හා 1942 අංක 18 දරන රා. සේ. අ. අ. ආඥා පනත අනුව පිළියෙල කරන ලදී.

(*ආ*) ගොඩනැගිලි කුළී විදුලිය හා ජල ගාස්තු

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලබන ගොඩනැගිලි කුළී, විදුලි ගාස්තු හා ජල ගාස්තු 1993 වර්ෂයේ සිට අරමුදල විසින් දැරීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදී. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවන ලද මෙම වියදම් පහත පරිදි විභජනය කර ඇත.

| *වියදම* | *පදනම* |
|---|---|
| ගොඩනැගිලි කුළී හා විදුලිය | භූමි ප්‍රමාණය |
| ජලය | සේවක සංඛ්‍යාව |

(*ඇ*) ස්ථාවර වත්කම් හා ක්ෂය ප්‍රතිපාදන

1. ස්ථාවර වත්කම් ගත් මිලට අගය කොට ඇත
2. ස්ථාවර වත්කම් මිලදී ගත් වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන නොකරන අතර විකිණීම් කරනු ලබන වර්ෂය වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන කරනු ලැබේ.
3. ක්ෂය වීම් කරනු ලබන්නේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගෙනයි. පහත සඳහන් පරිදි ප්‍රතිශතයන් අනුගමනය කරනු ලැබේ.

| | *ප්‍රතිශතය* |
|---|---|
| පරිගණක යන්ත්‍ර | 15% |
| කාර්යාල උපකරණ | 10% |
| ලී බඩු සවි කිරීම් | 10% |

(*ඈ*) ආදායම් හඳුනා ගැනීම

i. පොලී ආදායම් උපචිත පදනම මත ගණුම් ගත කර ඇත.

ii. සාමාජික ගාස්තු ලැබීම
සාමාජික ගාස්තු ලැබීම්, මුදල් පදනම මත ගිණුම් තබා ඇත.

(*ඉ*) ආයෝජන

ශේෂ පත්‍ර දිනට ආයෝජනවල වටිනාකම පිරිවැයට අගය කර ඇති අතර වෙළඳ අගයද ගණනය කර ගිණුම්වල දක්වා ඇත.

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල**

2006.12.31 න් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම

| | *2006* | | *2005* | |
|---|---|---|---|---|
| ජනවාරි 01 දිනට හා නි. ලේ. ශේෂය | | 937,642,479 | | 323,337,238 |
| ලැබීම් | | | | |
| අනිවාර්ය දායකය | 451,163,080 | | 496,376,529 | |
| රජයේ ප්‍රසාද මුදල් | 247,236,162 | | 251,182,617 | |
| පොලී ආදායම | 1,038,364,060 | | 1,000,483,475 | |
| සාවද්‍ය බැර | 67,649 | | 1,250,260 | |
| උපලබ්ධි වූ ආයෝජන | 2,055,822,410 | | 4,510,750,715 | |
| | 3,792,653,361 | | 6,260,043,596 | |

| | *2006* | | *2005* | |
|---|---|---|---|---|
| අඩු කළා :- | | | | |
| ගෙවීම් | | | | |
| අනිවාර්ය දායකය | 34,584,501 | | 26,238,678 | |
| රජයේ දායකය | 33,738,070 | | 23,194,706 | |
| නොගෙවූ ප්‍රසාද මුදල් | | | | |
| ඒකාබද්ධ අරමුදලට බැර කිරීම | 13,100,589 | | 12,056,488 | |
| පරිපාලන වියදම් | 3,835,171 | | 5,061,489 | |
| ස්ථාවර වත්කම් | 83,540 | | | |
| විගණන ගාස්තු | | | 262,037 | |
| සාවද්‍ය හර | 1,659,983 | | 2,135,501 | |
| මූලධන වත්කම් වැඩිදියුණු කිරීම | | | | |
| ගැලපුම් (අදායම් වියදම් ගිණුම) | - | | | |
| ආයෝජන | 3,064,014,353 | | 5,576,789,456 | |
| | | 641,637,154 | | 614,305,241 |
| දෙසැම්බර් 31 දිනට හා නි. ලේ. ශේෂය | | 1,579,279,633 | | 937,642,479 |

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල**

2006.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| | සටහන | 2006 | | 2005 | |
|---|---|---|---|---|---|
| ආදායම් : | | | | | |
| පොලී ආදායම් | | | 1,112,285,092 | | 1,006,535,865 |
| අඩු කළා : පොලී මත බදු (රඳවා ගැනීම) | | | 56,435,810 | | 42,327,082 |
| පොලී ආදායම් (බදු පසු) | 1 | | 1,055,849,281 | | 964,208,783 |
| අඩුකළා : වියදම් | | | | | |
| විදුලිය | | 253,760 | | 245,628 | |
| ජල ගාස්තු | | 29,858 | | 46,765 | |
| පුද්ගලික පඩි නඩි | | 5,863,036 | | 4,602,443 | |
| ගමන් වියදම් | | 1,190 | | 410 | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | | 73,379 | | 65,524 | |
| අලුත්වැඩියාව හා නඩත්තුව | | 55,640 | | 64,770 | |
| ප්‍රවාහන සම්බන්ධතා හා නිවාඩු දුම්රිය බලපත් | | 169,893 | | 243,996 | |
| විගණන ගාස්තු | | | | 300,000 | |
| ස්ථාවර වත්කම් ක්ෂය | | 72,517 | | 64,524 | |
| නිල ඇඳුම් | | | | | |
| තැපැල් ගාස්තු | | 23,290 | | 21,090 | |
| වෙනත් වියදම් | | 440 | 6,543,632 | 5,381 | 5,660,531 |
| වියදම ඉක්මවූ ආදායම | | | 1,049,305,649 | | 958,548,252 |
| පොදු සංචිත ගිණුමෙන් මාරු කළා | | | - | | 29,370,643 |
| දායකයන්ට විසර්ජනය කළ හැකි පොලිය | | | 1,049,305,649 | | 987,918,895 |
| දායකයින්ට පොලී විසර්ජනය කිරීම් | | | | | |
| අනිවාර්යය දායකය | | 428,436,073 | | 400,347,808 | |
| ස්වේච්ඡා දායකය | | 909,692 | | 934,231 | |
| රජයේ දායකය | | 619,315,249 | 1,048,661,014 | 581,965,921 | 983,247,960 |
| පොදු සංචිත ගිණුමට මාරු කළා | | | **644,635** | | **4,670,935** |

## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

### 2006.12.31 දිනට ශේෂ පත්‍රය

| *වත්කම්* | *සටහන* | *2006* | | *2005* | |
|---|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 2 | | | | |
| ලී බඩු | | 21,340 | | 23,711 | |
| කාර්යාලීය උපකරණ | | 295,172 | | 327,968 | |
| පරිගණක යන්ත්‍ර | | 211,643 | 528,155 | 248,992 | 600,671 |
| ආයෝජන : | 3 | | 12,069,709,646 | | 11,047,803,147 |
| ජංගම වත්කම් : | | | | | |
| ලැබිය යුතු ආයෝජන පොලී | | 322,057,201 | | 305,065,550 | |
| ලැබිය යුතු රජයේ දායකය | 4 | 1,013.381,581 | | 583,873, 124 | |
| ගැළපුම් ගිණුම | 5 | 3,900,463 | | 8,835,468 | |
| භාණ්ඩාගාර නියෝජනය ලේකම්ගේ ගිණුමේ ශේෂය | | 1,579,279,633 | 2,918,618,879 | 937,642,479 | 1,835,416,621 |
| මුලු වත්කම් | | | 14,988,856,680 | | 12,883,820,439 |
| ***ස්කන්ධය හා වගකීම්*** | | | | | |
| සමුච්චිත අරමුදල : | 6 | | | | |
| අනිවාර්යය දායකය | | 5,972,046,103 | | 5,133,558,790 | |
| ස්වේච්ඡා දායකය | | 12,224,268 | | 11,314,576 | |
| රජයේ දායකය | | 8,965,113,834 | 14,949,384,205 | 7,715,866,384 | 12,860,739,750 |
| සංචිත : | | | | | |
| ප්‍රාග්ධන සංචිතය | | 3,790 | | 3,790 | |
| පොදු සංචිතය | 7 | 19,176,582 | 19,180,372 | 18,531,947 | 18,535,737 |
| ජංගම වගකීම් : | | | | | |
| උපචිත විගණන ගාස්තු | | 600,000 | | 600,000 | |
| ණය හිමියෝ | | 13,220,987 | | 83,540 | |
| ගෙවිය යුතු රජයේ ප්‍රසාද මුදල | | | | 26,241 | |
| උපචිත ආයතන වියදම් | 8 | 6,471,116 | 20,292,103 | 3,835,171 | 4,544,952 |
| මුළු ස්කන්ධය හා වගකීම | | | 14,988,856,680 | | 12,883,820,439 |

එස්. එන්. හපුආරච්චි,
රා. සේ. අ. අ. කළමණාකාර මණ්ඩලයේ
ලේකම් හා ගණකාධිකාරී.
දිනය : 2007 අප්‍රේල් 09

කේ. ඒ. තිලකරත්න,
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හා
රා. සේ. අ. අ. කළමණාකාර
මණ්ඩලයේ සභාපති.
දිනය : 2007 අප්‍රේල් 09

3.5 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් :

| | *2006* | *2005* |
|---|---|---|
| 3.5.1 පොලී ආදායම් : | | |
| වර්ෂය තුළ පොලී ලැබීම් | 1,038,364,060 | 1,000,483,475 |
| ප්‍රාග්ධන ලාභ/අලාභ | 13,714,558 | (3,407,316) |
| | 1,052,078,618 | 997,076,159 |
| අඩුකළා : | | |
| ජනවාරි 01 දිනට ලැබිය යුතු පොලිය | 305,065,549 | 337,932,925 |
| වර්ෂයට අදාලව ලැබුණු පොලිය | 747,013,069 | 659,143,234 |

| | 2006 | 2005 |
|---|---|---|
| එකතු කළා : | | |
| දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය | | |
| 01. රුපියල් ණය | 168,845,688 | 167,693,308 |
| 02. භාණ්ඩාගාර බිල්පත් | 601,902 | 6,550,172 |
| 03. ස්ථාවර තැන්පත් | 183,192 | - |
| 04. භාණ්ඩාගාර බැඳුම්කර | 152,425,419 | 130,822,069 |
| | 322,057,201 | 305,065,549 |
| අඩු කළා - බදු වෙන් කිරීම | 13,220,987 | - |
| වර්ෂයට අදාළ පොලිය | 1,055,849,281 | 964,208,783 |

3.5.2 ස්ථාවර වත්කම් :

| පිරිවැය | ලීබඩු හා සවිකිරීම | කාර්යාල උපකරණ | පරිගණක උපකරණ | මුළු අගය |
|---|---|---|---|---|
| 2006.01.01 දිනට ශේෂය | 48,946 | 665,315 | 468,821 | 1,183,082 |
| එකතු කළා | - | - | - | - |
| 2006.12.31 දිනට ශේෂය | 48,946 | 665,315 | 468,821 | 1,183,082 |
| සමුච්චිත ක්ෂය : | | | | |
| 2006.01.01 දිනට ශේෂය | 25,235 | 337,346 | 219,830 | 582,411 |
| වර්ෂය අය කිරීම් | 2,371 | 32,797 | 37,349 | 72,517 |
| 2006.12.31 දිනට සමුච්චිත ක්ෂය | 27,606 | 370,143 | 257,179 | 654,928 |
| 2006.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම | 21,340 | 295,171 | 211,643 | 528,155 |
| 2005.12.31 දිනට ශුද්ධ පොත් වටිනාකම | 23,711 | 327,969 | 248,991 | 600,671 |

3.5.3 *ආයෝජන :*

ශ්‍රී ලංකා මහ බැංකුවේ කර ඇති ආයෝජන වල ගත් මිල රුපියල් මිලියන 12,070 ක් විය.

3.54 *ලැබිය යුතු රජයේ දායක මුදල :*

මින් නිරූපණය වන්නේ ඒකාබද්ධ අරමුදලින් අනිවාර්ය දායකය වන 8% ක ප්‍රමාණයට සාපේක්ෂව රජයෙන් ලැබිය යුතු 12% ක ප්‍රමාණය වන අතර වර්ෂ අවසානයේ නොලැබුණ ප්‍රමාණය මින් නිරූපණය වේ.

3.5.5 *ගැලපුම් ගිණුම :*

මෙම ගිණුමෙන් දක්වා ඇත්තේ වෙනත් දෙපාර්තමේන්තු වලින් කරනු ලබන සාවද්‍ය හර හා බැර කිරීම් වේ. මෙවැනි සාවද්‍ය හර හා බැර එම දෙපාර්තමේන්තු වලට දන්වනු ලබන අතර ඔවුන් නිවැරදි කිරීම් කළ පසු මෙම ශේෂයෙන් නිරවුල් වනු ඇත.

3.5.6 *සමුච්චිත අරමුදල :*

දායක ගිණුම් සඳහා බැරට ඇති ශේෂයන් මෙයින් නිරූපනය කරන අතර මෙහි අනිවාර්ය දායකය, ස්වේච්ඡා දායකය, රජයේ දායක මුදල හා මෙම කොටස් වලට අයත් පොලිය ද ඇතුළත් වේ.

3.5.7 *පොදු සංචිතය :*

මෙම ගිණුමෙන් දැක්වෙනුයේ ආසන්න ප්‍රතිශත කාර්තුව සඳහා පොලිය විසර්ජනය කිරීමෙන් අනතුරුව ඉතිරි වූ ශේෂයයි. මෙම වර්ෂයේදී ආසන්න ප්‍රතිශත කාර්තුවට පොලිය විසර්ජනය කිරීමෙන් පසු ඉතිරි වූ රු. 644,635 ක් පොදු සංචිත ගිණුමට මාරු කරන ලදී. 2006.12.31 දිනට ශේෂය රු. 19,176,582 ක් වේ.

3.5.8 *උපචිත වියදම් :*

සමාලෝචිත වර්ෂය තුළ ඒකාබද්ධ අරමුදලින් දැරූ වියදම් මීත් නිරූපනය වන අතර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විදුලිය හා ජලය වෙනුවෙන් වියදම් කරන ලද රු. 598,960 ක මුදලද මෙයට ඇතුළත් කර ඇත.

| | *2006* | *2005* |
|---|---|---|
| විදුලිය හා ජලය | 283,618 | 598,960 |
| පරිපාලන වියදම් | 6,187,498 | 3,236,211 |
| | 6,471,116 | 3,825,171 |

එස්. එන්. හපුආරච්චි,
රා. සේ. අ. අ. කළමණාකාර මණ්ඩලයේ
ලේකම් හා ගණකාධිකාරී.
දිනය : 2007 අප්‍රේල් 09

කේ. ඒ. තිලකරත්න,
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හා
රා. සේ. අ. අ. කළමණාකාර
මණ්ඩලයේ සභාපති.
දිනය : 2007 අප්‍රේල් 09

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරය) 24(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 *විගණන විෂය පථය :*

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 *මතය :*

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2006 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් උක්ත පොත් වලට එකඟව පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට සහ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සහ මූල්‍ය ප්‍රකාශන සමග දී ඇති සටහන් (අංක 01 සිට 08 දක්වා) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 *මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම :*

2.2.1 *ගණකාධිකරණ අඩුපාඩු :*

සමාලෝචිත වර්ෂයේ අවසානයට සාවද්‍ය හර ශේෂවල එකතුව රු. 3,985,942 ක් වූ අතර සාවද්‍ය බැර ශේෂවල එකතුව රු.85,479 ක් වුයෙන් එකිනෙකට හිලව් කළ රු. 3,900,463 ක් වූ ශුද්ධ හර ශේෂය ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. මෙම සාවද්‍ය හර හා බැර ශේෂයන්හි ඇතුළත් වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවති පිළිවෙලින් රු. 2,703,686 ක් සහ රු. 85,133 ක් වූ

ශේෂ ඇතුළත් විය. සාවද්‍ය හර ශේෂයන් අතරින් රු. 1,591,724 ක් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටද රු. 1,114,259 ක් පොලිස් දෙපාර්තමේන්තුවටද අදාළ වූ අතර සාවද්‍ය බැර ශේෂ අතරින් රු. 25,000 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවටද රු. 22,444 ක් නීතිපති දෙපාර්තමේන්තුවටද අදාළ විය.

2.2.2 *නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම :*

අංක අයිජ්අයි 2002-02 දරන හා 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර පරිගණක යන්ත්‍ර මිලදී ගැනීමේ සිට අපහරණය දක්වා සියළු විස්තර ඇතුළත් කළ යුතු වුවත් අරමුදලේ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් එසේ වාර්තා තබා නොතිබුණි.

2.2.3 *අවිධිමත් ලෙස දායක මුදල් ආපසු ගෙවීම :*

විස්තරාත්මක අවකරණ ලේඛන අරමුදල වෙත ඉදිරිපත් කර නොතිබියදී, ඒ ඒ අවස්ථාවේදී සහතික කර එවන අය වාර්තා පදනම් කරගෙන දායක මුදල් ආපසු ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ නියැදි පරීක්ෂණයේදී හෙලිවූ අවස්ථා 08 ක එසේ ගෙවන ලද රු. 119,451 ක නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 *මූල්‍ය ප්‍රතිඵල*

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය දායකයින් වෙත විසර්ජනයට පෙර රු. 1,049,305,649 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 987,918,895 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට මූල්‍ය ප්‍රතිඵලයේ රු. 61,386,754 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණ.

3.2 *සාමාජිකයින්ට හිමිවූ පොලී ප්‍රතිශතය*

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 10 තුළදී අරමුදල මගින් සාමාජිකයින්ට හිමිකරදී ඇති පොලී ප්‍රතිශතයන් පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.

| *වර්ෂය පොලී ප්‍රතිශතය* | *1996* | *1997* | *1998* | *1999* | *2000* | *2001* | *2002* | *2003* | *2004* | *2005* | *2006* |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| % | 14 | 13.25 | 12.5 | 12 | 11.75 | 11.25 | 10.75 | 10.5 | 10.25 | 9. | 8.04 |

උක්ත විශේලේෂණය අනුව අරමුදල මගින් සාමාජිකයින්ට ගෙවන වාර්ෂික පොලී ප්‍රතිශතයේ ක්‍රමික පහළයාමක් නිරීක්ෂණය වන අතර 1996 හා 2006 වර්ෂ සැසඳීමේදී 1996 වර්ෂයට සාපේක්ෂව 2006 වර්ෂයේ පොලී ප්‍රකාශනය 42.57% කින් අඩු වී ඇති බව අනාවරණය විය. රජයේ දෙපාර්තමේන්තුවල 8% ක අනිවාර්ය දායකය මුදලින් නොලැබී ගිණුම් සාරාංශ මගින් බැරවීමත්, 12% ක් වූ රජයේ දායක සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීමත් නිසා නව ආයෝජන අවස්ථා අඩුවීම මෙම තත්වයට හේතුවක් වී ඇති බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා මා වෙත වාර්තා කර තිබුණි.

3.3 *සාමාජිකයින් සංඛ්‍යාවෙහි හා ආයෝජන වර්ධනයෙහි උපනතිය :*

2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂ 5 සඳහා සාමාජිකයින් සංඛ්‍යාවෙහි හා ආයෝජනයෙහි වර්ධනය එක් එක් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අගයන් මත වූ උපනති විශ්ලේෂණයක් පහත සඳහන් සටහනින් දැක්වේ.

| | *2002* *%* | *2003* *%* | *2004* *%* | *2005* *%* | *2006* *%* |
|---|---|---|---|---|---|
| සාමාජික සංඛ්‍යාවේ වර්ධනය | 0 | 0 | 4.22 | 14.42 | 5.08 |
| අරමුදලේ ආයෝජන වල වර්ධනය | 14.03 | 32.79 | 19.54 | 10.64 | 9.25 |

2002 හා 2003 වර්ෂ වල සාමාජික සංඛ්‍යාවෙහි වර්ධනයක් නොතිබුණද ආයෝජනවල වර්ධනයේ ඉහළයාමක් සිදුවී තිබුණු නමුත් 2004 වර්ෂයේ සිට සාමාජික සංඛ්‍යාවෙහි වර්ධනයක් පැවතියද අරමුදලේ ආයෝජන වර්ධන වේගය ක්‍රමිකව අඩු වී තිබුණි. සාමාජිකයින් වැඩි පිරිසක් සිටින රජයේ දෙපාර්තමේන්තුවල දායක මුදල් ගිණුම් සාරාංශ මගින් බැරවීම හා රජයේ දායක සඳහා මුදල් නොලැබීම නිසා, අමතර ආයෝජන අඩුවීම මෙම තත්ත්වයට බලපා ඇති බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා මා වෙත වාර්තා කර තිබුණි.

3.4 *කාර්ය සාධනය :*

පහත සඳහන් නිරීක්ෂණයෙන් කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අරමුදලේ ක්‍රියකාරකම්වල අපේක්ෂිත ඉලක්කයක් හා තථ්‍ය තත්ත්වය පහත වේ.

| | *ක්‍රියාකාරකම* | *අපේක්ෂිත ඉලක්ක* | *2006 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය* | *2006 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය* |
|---|---|---|---|---|
| (i) | දායකයින් ලියාපදිංචි කිරීම | 10,000 | | 100% |
| (ii) | දායක මුදල් එකතු කිරීම (රු. මි.) | 852 | 75% | 75% |
| (iii) | අමතර මුදල් ආයෝජනය (රු. මි.) | 2,000 | 51% | |
| (iv) | දායකයින්ට ප්‍රතිලාභ ගෙවීම (රු. මි.) | 100 | 50% | 50% |

(ආ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 1/97 දරන හා 1997 ජූලි 31 දිනැති චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව සෑම මාසයක් තුළම අරමුදලට බැර කරනු ලබන මුදල් පිළිබඳ නිවේදනයක් ඊළඟ මාසයේ 15 දිනට පෙර අරමුදලේ ලේකම් වෙත අදාළ ආයතනය එවිය යුතු වුවත්, 2006 වර්ෂය සඳහා මෙම නිවේදන එවා තිබුණේ ආයතනයන් 04 කින් පමණි. එම නිවේදන ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා වී නොතිබුණි.

3.5 *සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම්දීම :*

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ 25 වගන්තිය ප්‍රකාර එක් එක් මුදල් වර්ෂය අවසන්වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතුවේ. 2006 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදලෙහි මුළු සාමාජික සංඛ්‍යාව 208,012 ක් වුවද පොලිස් උපසේවා නිලධාරීන් 35,000 කට පමණක් 2006 ඔක්තෝබර් 31 දින දක්වා ශේෂයන් පිළියෙල කර ඇති බව මා වෙත දන්වා ඇත. අවකරණ ලේඛණ නොලැබීම සහ එක් එක් දායකයා සඳහා වෙනම ගිණුම් යාවත්කාලීනව පවත්වාගෙන නොයෑම හේතුවෙන් වර්ෂ ගණනාවක සිටම වර්ෂ අවසාන ශේෂය සාමාජිකයන් වෙත දැනුම්දීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. ක්‍රියාකාරී හා ක්‍රියාකාරී නොවන සාමාජිකයන් වෙන වෙන්ව හඳුනාගත හැකි පරිදි සාමාජික ලේඛන යාවත්කාලීනව පිළියෙල කර නොතිබුණි.

3.6 *රජයේ දායක මුදලේ අධිකය :*

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධානයන්ට අනුව අනිවාර්ය දායක මුදල මෙන් 1.5 ක ගුණයක් රජය විසින්, රජයේ දායක මුදල් ලෙස අරමුදලට බැර කළ යුතුය. 2006 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය දායක මුදලේ වූ රු. 5,972,046,103 ක ශේෂය මෙන් 1.5 ක ගුණය වූ රු. 8,958,069.154 ක් රජයේ දායක මුදල් ගිණුමේ තිබිය යුතු වුවත්, එහි ශේෂය රු. 8,965,113,834 ක් වූයෙන් රජයේ දායක මුදල තුළ රු. 7,044,680 ක අධිකයක් නිරූපනය විය. මේ අයුරින් අධිකයක් උද්ගතවීම, පවත්වාගෙනයාම හා අධිකයක් සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ විධිවිධාන රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් පනත තුළ අන්තර්ගතවී නොතිබුණි. පනතේ ඇතුළත් කර නොමැති විධිවිධාන සම්බන්ධයෙන් තීරණ ගැනීමට කළමණාකරන මණ්ඩලයට බලතල තිබෙන බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වරයා වාර්තා කර තිබුණි.

**4. පද්ධති හා පාලන**

*පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය :*

(අ) අවකරණ ලේඛන ලබාගැනීම
(ආ) දායක මුදල් ගෙන්වා ගැනීම
(ඇ) මුදල් පොත ඇතුළු පොත්පත් නිසි ලෙස පවත්වාගෙන යාම
(ඈ) සාවද්‍ය හර හා බැර ශේෂයන් නිරවුල් කිරීම
(ඉ) විගණන නිරීක්ෂණ සම්බන්ධව කටයුතු කිරීම
(ඊ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම.

පී. ඒ. පේමතිලක,
*වැඩබලන විගණකාධිපති.*

**2006.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් කළමනාකරණ මණ්ඩලයේ නිරීක්ෂණ**

**2.2 මූල්‍ය ප්‍රකාශණ පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සාවද්‍ය හර හා බැර ශේෂයන් හි පවතින වසර 5 කට වඩා පැරණි ශේෂයන් නිරවුල් කරන ලෙසට අදාළ දෙපාර්තමේන්තුව හා අමාත්‍යාංශ වෙත ලිඛිතව මෙන්ම දුරකථන පණිවිඩ මගින් දැනුම් දුන්නත් එම ආයතන මෙම තත්වයන් නිරවුල් කිරීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නැත. එබැවින් ඉහත ගැටළු සහගත තත්වයන් නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇත.

2.2.2. නීති, රීති, රෙගුලාසි වලට අනුකුල නොවීම.

පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් සකස්කර නොමැති අතර ඉදිරියේ දී මෙවැනි ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 දායක මුදල් ගෙවීම

සියලුම මුදල් ගෙවීම් සිදු කරන්නේ අවකරණ ලේඛන පදනම් කර ගෙනය. 2007 වර්ෂයේ අවකරණ වාර්තා ලැබෙන්නේ 2008 වර්ෂයේ දී බැවින් 2007 වර්ෂය සඳහා සිදු කරනු ලබන ප්‍රදානයන්හි දී දායක මුදල් අයකර තිබේ නම් ඒ පිළිබඳ සහතික කරන ලද අය වාර්තාවක් ගෙන ගෙවීම් කටයුතු කරනු ලැබේ.

එමෙන්ම අවුරුදු 10ට 15 කට වඩා පැරණි වර්ෂ වෙනුවෙන් අවකරණ ලේඛන සමහර ආයතන විසින් ඉදිරිපත් නොකිරීම නිසා එවන් අවස්ථාවන් හිදී දායකයන්ට සිදුවන අපහසුතා මඟ හැරීම සඳහා අදාල ආයතනයෙන් සහතික කරන ලද අය වාර්තා ලබා ගෙන ප්‍රදාන ගෙවීම් කිරීම සඳහා කටයුතු කිරීමට 2005.08.24 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී අරමුදලේ ලේකම් හා ගණකාධිකාරිට බලය ලබා දී තිබේ.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.2 සාමාජිකයන්ට හිමි වූ පොලී ප්‍රතිශතය

1996 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා ආයෝජන ආදායම් ලැබීම් වැඩිවීමේ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් දායක මුදල් ලැබීම් වැඩි වීම නිසා 1996 වර්ෂයට සාපේක්ෂව 2006 වර්ෂයේදී විසර්ජනය කල පොලී ප්‍රතිශතය අඩු වී ඇත. එයට හේතුව වන්නේ අරමුදලේ ආයෝජන රඳාපවතින්නේ නැවත ආයෝජන මත පමණක් වන අතර අමතර මුදල් ලැබීම සුළු වශයෙන් සිදුවීමද, එමෙන්ම පසුගිය වර්ෂවල වැඩි පොලී අනුපාත මත ආයෝජනය කරන ලද මුදල් උපලබ්ධි වූ පසු නැවත ආයෝජනය කිරීම සිදුවන්නේ අඩු පොලී අනුපාතයකින් වීමක් ය. තවද අරමුදලේ සාමාන්‍ය දායක මුදල් අයවීම් වැඩි වුව ද 8% මුදල මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු මගින් බැර කරන්නේ ගිණුම් සාරාංශ මගින් වීම නිසා ඒ සඳහා මුදල් ලැබීමක් සිදු නොවේ. එමෙන්ම 12% කොටස සඳහා ද පසුගිය වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබී නොමැත. මේ තත්වය නිසා අලුත් ආයෝජන අවස්ථාවන් සඳහා ඉඩ කඩ නොලැබෙන අතර ප්‍රති ආයෝජන පමණක් සිදු කෙරේ. එබැවින් පෙර වර්ෂවල ලද පොලී වැඩිවීම් සුළු වැඩිවීමකින් සිදුවෙද්දී දායක මුදල් ප්‍රමාණය අධිකව වැඩිවීම මත, ඉහත සුළු වැඩි වීම වැඩි කොටසක් අතර බෙදීම නිසා 1996 වර්ෂයට සාපේක්ෂව 2006 වර්ෂයේ දී විසර්ජනය කරන ලද පොලී අනුපාතය අඩු වීම සිදු වී ඇත.

3.3 සාමාජිකයන් සංඛ්‍යාවෙහි හා ආයෝජන වර්ධනයෙහි උපනති.

සාමාජික සංඛ්‍යාවේ වර්ධනයක් සිදුවුවත් ආයෝජන වල වර්ධනයක් සිදුවී නොමැත්තේ ආයෝජනය සඳහා අමතර අරමුදල් නොලැබීම නිසාය. එයට හේතුව වන්නේ 2004 වර්ෂයට සාපේක්ෂව 2005 සහ 2006 වර්ෂවල 12% කොටස සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම සහ සාමාජික සංඛ්‍යාවෙන් වැඩි ප්‍රමාණයක් නියෝජනය වන මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ වලින් දායක මුදල් බැර කිරීම සිදුවන්නේ ගිණුම් සාරාංශ මගින් වීම නිසා සත්‍ය වශයෙන්ම අරමුදලට මුදල් නොලැබීමයි. මේ තත්වය නිසා අරමුදල රැඳී ඇත්තේ ප්‍රති ආයෝජනය මතය. මේ නිසා සාමාජික සංඛ්‍යාවේ වර්ධනය සමඟ ආයෝජනවල වර්ධනයක් සිදුවිය නොහැකි බව දන්වන අතර එසේ වීමට නම් අරමුදල සඳහා බැර කරන ලද දායක මුදල් සියල්ලම මුදලින් ලබා ගැනීමට හැකියාවක් තිබිය යුතුය. එසේ වුවහොත් ආයෝජන වර්ධනය කර ගැනීමට හැකියාවක් තිබේ.

3.4 කාර්ය සාධනය

(අ) 2006 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සහ තත්‍ය පිළිබඳ නිරීක්ෂණ පහත පරිදිය.

(අ) දායකින් ලියාපදිංචිය 10,000 කට අපේක්ෂා කල අතර 2006.12.31 වන දින විට 10,683 කට සාමාජිකත්වය ලබා දී ඇත. ඒ අනුව අපේක්ෂිත ඉලක්ක සපුරා ඇත.

(ආ) දායක මුදල් එකතු කිරීම රු. මි. 852ක් අපේක්ෂා කල ද රු. මී. 698ක් එකතු විය. එයට හේතුව වන්නේ රජයේ ප්‍රසාද මුදල (12%) සඳහා 2006 වර්ෂයේ දී ඇස්තමේන්තුගත රු. මී. 250 නොලැබෙන බැවින් දායක මුදල් එකතු වීමේ අඩුවක් විය. කෙසේ වුවද 75% ක ප්‍රමාණයක් එකතු කර ගැනීමට හැකි විය.

(ඇ) අමතර මුදල් ආයෝජන මිලියන 2000 ක් අපේක්ෂා කරන ලද්දේ නමුත් මුළු ආයෝජන වශයෙන් රු. 3,064 ක් ආයෝජනය කරන අතර මෙහි බොහොමයක් ප්‍රති ආයෝජන මත රඳා පවතින අතර, අරමුදල් සඳහා ඉහත I හා II හි සඳහන් වන පරිදි 2006 වර්ෂයේදී දායක මුදල් සඳහන් මුදලින් ප්‍රතිපාදන නොලැබීම මත අමතර ආයෝජන වල අඩුපාඩුවක් සිදු වී ඇති අතර එයට හේතුව වන්නේ 8% ක මුදල ගිණුම් සාරාංශ මගින් බැර කිරීමත් 12% සඳහා රජයේ මුදල් නොලැබීමත් ය.

(ඇ) දායකයින්ට ප්‍රතිලාභ ගෙවීමේදී ලැබුන අයදුම්පත් සංඛ්‍යාවෙන් 50% ක් ගෙවීම් කිරීමට හැකි විය. ඊට හේතුව වන්නේ 2006 වර්ෂයේ දායක විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා පත්වීම් ලද අයගේ ප්‍රදානයන් සඳහා ලැබුන අයදුම්පත් බොහොමයක් දායක මුදල් පනත අහෝසි කර ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් ලැබෙන තෙක් ගෙවීම් නොකර රඳවා ගෙන සිටීමය. මේ නිසා ප්‍රදාන ඉල්ලුම් කරමින් ලද අයදුම්පත්‍ර සියල්ලම සඳහා ගෙවීම් කල නොහැකි විය.

(ආ) 1/97 දරන චක්‍රලේඛයට අමතරව 14/2006 හා 2006.10.30 දිනැති චක්‍රලේඛය මගින් ද බැර නිවේදන එවන ලෙසට සියලුම දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ දැනුවත් කර තිබුනත් අදාල ආයතන බැර නිවේදන එවීමක් සිදු නොකරන අතර චෙක්පත් සමග හෝ වෙනත් ආකාරයට ලැයිස්තුවක් ඉදිරිපත් කරයි. නිවේදන ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොමැති යනුවෙන් සඳහන් වීම පිලිගත නොහැකි අතර අදාල ආයතනය මේ සඳහා ප්‍රතිචාර නොදැක්වීම නිසා අරමුදල මඟින් ගනු ලබන ඵලදායි ක්‍රියාමාර්ග වල ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ලගා නොවන බව දන්වා සිටිමි.

3.5 සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයන් වෙත දැනුම්දීම.

දැනට 1999 වර්ෂය දක්වා පමණක් ශේෂ දැනුම් දී ඇති අතර නව පරිඝණක වැඩසටහනක් දැනට සකස් කර ගෙන යන අතර ඉදිරියේදී සියලුම සාමාජිකයන් සඳහා දත්ත ඇතුලත් කිරීම සිදු කර ශේෂයන් දන්වා යැවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟ වෙමි.

3.6 රජයේ ප්‍රසාද මුදල් අධිකය

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල පාලනය වන්නේ පනතෙන් මෙන්ම පනත මගින් ස්ථාපනය කරන ලද කළමනාකරණ මණ්ඩලයක් මගිනි. එබැවින් පනතේ සියලුම විධි විධාන ඇතුලත් කර නැති අතර අදාල අවස්ථාවන්හිදී කළමනාකරණ මණ්ඩලය මගින් විවිධ තීරණ ගැනීම සිදු කරයි. ඒ අනුව මෙම අධිකය සමහර අවස්ථාවන්හිදී පොළී විසර්ජන කටයුතු සඳහා ද භාවිතා කර ඇත. මෙම අධිකයට හේතු වන්නේ අරමුදලින් මුදල් ගැනීම සඳහා සාමාජිකයන් ඉදිරිපත් නොවීම, එමෙන්ම සාමාජිකත්වය අහෝසි වී බොහෝ කාලයක් ගත වූ පසු ප්‍රදාන සඳහා ඉල්ලුම් කිරීමය. එම නිසා මෙම අරමුදල් ආයෝජනය මගින් ලැබෙන ප්‍රතිලාභ අදාල ගිණුම් වලට බැර වීම නිසා අධික ඇති වේ. එමෙන්ම රජයේ ප්‍රසාද මුදල් සඳහා මහා භාණ්ඩාගාරය මගින් මුදල් නොලැබෙන විට ඒ සඳහා අදාල වර්ෂයේ අනිවාර්ය දායක මුදලෙන් 1.5 ගුණයක් ලැබිය යුතු රජයේ ප්‍රසාද මුදල් ගිණුමකට මාරු කිරීමක් සිදුකරයි.

කේ. ඒ. තිලකරත්න,
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් හා
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් කළමණාකරණ මණ්ඩලයේ සභාපති.

11-238

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී - හලාවත ශාඛාව**
**(කළින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඊ. පින්ටෝ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2004.05.27 දින සහ අංක 4194 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, වර්ණකුලසූරිය නිමල් නිකලස් ප්‍රනාන්දු සහ වීරපුරගේ රංජිත තරංග ණයකරුවන් හැටියට. පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ පනස් තුන්දහස් තුන්සිය නවයයි ශත හැටඅට (රු. 6,53,309.68)ක මුදලක් 2007.12.31 දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 6,53,309.68 ක මුදලට 2008.01.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 4194 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත, මහ ලේකම් කොට්ඨාසය තුළ ලියාපදිංචි වී ඇති මුන්නේස්වරම් පත්තුවේ උතුරු පිටිගල් කෝරළේ ඉනිගොඩවෙල, ග්‍රාමසේවක කොට්ඨාසයට අයත් ඉනිගොඩවෙල ග්‍රාමයෙහි "සීදුව වත්ත" නමැති ඉඩමට බලයලත් මානක එම්.එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් 2001 අප්‍රේල් මස 16 වන දින අංක 3388 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 2 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට උතුරට : පාරක් සඳහා වෙන් කළ ලොට් 34න් ද එම්යූ.පී.පීයූ හි 2308 න් ද ; නැගෙනහිරට: ලොට් 41න්ද එම්.යූ.පී.පීයූ හි 2308 න් ද; දකුණට : යෝගා පෙරේරාට සහ එම්.එම්. ලලනී ප්‍රනාන්දුට අයත් ඉඩමෙන් ද සහ බස්නාහිරට: පිඹුරු අංක 3388 ට අයත් ලොට් 1 න් ද මායිම් වූ

පිඹුර ප්‍රකාරව පර්චස් තිස්නවයයි දශම නවයයි තුන (අ. 0,රූ. 0, පර්. 39.93) ක විශාල ඉඩම හලා/30/156හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
මාණ්ඩලික සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

11-268/6

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - හෝමාගම ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2004.09.16 දින සහ අංක 2472 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. සේනානායක විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2005.01.08 වැනි දින සහ අංක 1367 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, කනිෂ්ක ගයා විතාරණ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස් දෙලක්ෂ හතලිස්දෙදහස් නවසියවිසිතුනයි ශත පනස්දෙකක (රු. 52,42,923.52) මුදලක් 2008.05.30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී (රු. 52,42,923.52) ක මුදලට 2008.05.31 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 2472 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවට අයිති නාවින්න, සුචරිත පාරෙහි පිහිටි වරිපනම් අංක 82/1හි "බණ්ඩාරවිල කුඹුර" නමැති ඉඩමට බලයලත් මානක බී. යූ. එස්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 735 සහ 2003 අගෝස්තු මස 3 වැනි දින දරණ පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 13 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 27 න් සහ පිඹුරු අංක 2000/180ට අයත් ලොට් අංක 3 දරන ඉතිරි කොටසින් ද; නැගෙනහිරට : පිඹුරු අංක 2000/180ට අයත් ලොට් අංක 3 හි ඉතිරි කොටසින් ද ; දකුණට : ලොට් 14න්ද සහ ලොට් 15න්ද සහ බස්නාහිරට : ලොට් 26 න් ද මායිම් වූ එකී අංක 735 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතක (අ.0, රූ. 0, පර්. 7 ) ක විශාල ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2692/37හි ලියාපදිංචි කර ඇත.

අංක 2472 සහ 1367 දරන බැඳුම්කරයන්හි දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-268/7

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - පානදුර ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2006.10.09ක දින සහ අංක 2007.05.17 දිනැති පිළිවෙලින් අංක 1730 සහ 1958 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, පුබුදු ප්‍රසාද් රූපසිංහ තනි අයිතිකරු පැස්ටේජ් ලංකා එන්ටර්ප්‍රයිසස් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්නම ලක්ෂ තිස්තුන්දහස් හයසිය අනූඑකයි ශත අනූව (රු. 49,33,691.90)ක මුදලක් 2008.06.30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 49,33,691.90 ක මුදලට 2008.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1730 සහ 1958 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පානදුර තල්පිටි දෙබැද්ද, තන්ත්‍රිමුල්ල උප කාර්යාලය සීමාව තුළ හිරණ පිහිටි හිග්ගහවත්ත දරන ඉඩමට බලයලත් මානක බී. වී. එස්. ප්‍රනාන්දු විසින් 2001.06.02 දින සහ පිඹුරු අංක 1012 ප්‍රකාර ඉඩම් කොටසට මායිම් වන උතුරට : පිඹුරු අංක 3251 හි ලොට්

අංක බී, එෆ් සහ ඊ (පාර) දරන කොටස් වලින් ද ; නැගෙනහිරට : පිඹුරු අංක 3251 හි ලොට් ඊ (පාර) ද ; දකුණට: පාර සහ පිඹුරු අංක 3251 ලොට් අංක සී වලින් ද සහ බස්නාහිරට: පිඹුරු අංක 3251 හි ලොට් අංක සී වලින් ද මායිම් වූ රූඩ් දෙකයි පර්චස් අට (අ.0, රූ. 2, පර්. 8) ක් විශාලත්වය ඇති ඉඩම, ගොඩනැගිලි සහ සියලුදේත් සමග වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 528/63 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-268/1

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - නුගේගොඩ ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක්වූ සැප්තැම්බර් මස 25 වන දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2006.08.22 දින සහ අංක 2492 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, පොල්වත්තගෙ රවීන්ද්‍ර ගෝමිස් සහ පොල්වත්තගේ ධර්මසේන ගෝමිස් යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එකසිය හතලිස් නමලක්ෂ හැටනමදහස් හැටනමයයි ශත තිස්එකක (රු. 1,49,69,069.31 මුදලක් 2008.01.31 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,49,69,069.31 ක මුදලට 2008.02.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 2492 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ,පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාව තුළ කළුබෝවිල, පිහිටි සිරිගල් මාවතේ, වරිපනම් අංක 21ඒ ලෙස දැක්වෙන කොස්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්.වික්‍රමසිංහ විසින් 2005.05.17 දින මැන සාදන ලද පිඹුරු අංක 3368/9000 ප්‍රකාර ලොට් අංක එක්ස් දරන ඉඩම් කොටසට මායිම් වන උතුරට : සිරිගල් මාවතේ, වරිපනම් අංක 19/3 න් සහ ධර්මසේන ගෝමිස්ට හිමිකම් කියන ඉඩමෙන් ද; නැගෙනහිරට: කොළඹ අගරදගුරු හිමිකම් කියන ඉඩමෙන් ද; දකුණට : සිරිගල් මාවතේ, වරිපනම් අංක 21 න් ද සහ බස්නාහිරට : සිරිගල් මාවතෙන් ද මායිම් වූ රූඩ් එකයි පර්චස් විසිහයක (අ. 0, රූ. 1, පර්. 26)ක් විශාලත්වය ඇති පිඹුරු අංක 3368/9000 ට අනුව ඇති ඉඩම වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2982 /116 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-268/2

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මරදාන ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008ක්වූ සැප්තැම්බර් මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. සමරනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2006.10.27 දින සහ අංක 1278 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, නාරාහේන්පිටි පතිරැන්නැහැලාගේ ෂදීජ් පතිරණ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දාසය ලක්ෂ හැත්තෑනමදහස් එකසිය අසූහයයි ශත තිස්හතර (රු. 16,79,186.34) මුදලක් 2008.06.24 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 16,79,186.34 ක මුදලට 2008.06.25 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1278 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ආර්. එස්. මහානාම මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ කහතුඩුව පිහිටි "කහතුඩුව

ස්ටේට්" නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක එම්. සමරනායක විසින් මැන සාදන ලද 2002.08.01 සිට 11 දක්වා දිනයන්හි අංක 8244 දරණ පිඹුරේ ලොට් අංක 178 දරන කොටස වන උතුරට: ලොට් අංක ආර්. 39 සහ ආර්.40 ද ; නැගෙනහිරට: ලොට් අංක ආර් 40 සහ 179 න් ද ; දකුණට: ලොට් අංක 189 සහ 188 න් ද සහ බස්නාහිරට : ලොට් අංක 177 න් ද මායිම් වූ පර්චස් දහයයි දශම හතක ( අ. 0, රූ. 0, පර් 10.7 ) ක් විශාලත්වය ඇති ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියළුදේත් වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒන 339/213 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 1278 දරන උකස් බැඳුම්කරයේ උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති පිඹුරු අංක 8244 හි ලොට් අංක ආර් 39 සහ ආර් 40 මතින් මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

11-268/5

---

## මහජන බැංකුව-මාතර උයන්වත්ත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29"ඩී" වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.05 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. එස්. රූපසිංහ විසින් සහතික කරන ලද 1996.03.20 දිනැති අංක 6187 දරන උකස් කර ප්‍රකාර ගෙවීම් දිල්ලිමුණි පත්මසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 6187 යටතේ රුපියල් දෙලක්ෂ හැට හතර දහස් තුන්සිය අසූ දෙකයි ශත අසූපහක (රු. 2,64,382.85) මුදලක් මහජන බැංකුවට දැනට අයවිමට ඇති බැවින් ද, 1997.10.10 වැනි දින සිට වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් රුපියල් දෙලක්ෂ හැටහතර දහස් තුන්සිය අසූ දෙකයි ශත අසූපහක (රු. 2,64,382.85) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා ආදල මහජන බැංකු පනතේ 29"එල්" වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් දෙලක්ෂ හැටහතර දහස් තුන්සිය අසූ දෙකයි ශත අසූපහක (රු. 2,64,382.85) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 6187 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතේ සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දික්වැල්ල, වත්තේගම දකුණට පිහිටි මාතර පාරේ වරිපනම් අංක 95 දරන කහවත්තෙගෙවත්ත නමැති ඉඩමෙන් මාතර දිස්ත්‍රික් උසාවියේ අංක පී 7880 දරන බෙදුම් නඩුව ප්‍රකාරව එම නඩුවට ගොනු කර ඇති 1986.03.16 දිනැති එජ්. විජේවීර බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 3028 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද අංක 2 දරන කැබැල්ලේ කොටසක් සහ අංක 03 දරන කැබැල්ල ද, ඒකාබද්ධව සෑදුන 1996.01.28 දිනැති බී. ජී. කරුණාදාස බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 1032 දරන පිඹුරේ පිළිබිඹු කර ඇති ඉඩම් කැබලි දෙකෙන් අංක 3 දරන කැබැල්ලෙන් ඉහත කී අංක 1032 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද අංක 2 දරන ඉඩම් කැබැල්ලට එම පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේ අංක 1 දරන කැබැල්ල ද, නැගෙනහිරට : පාර ද, දකුණට : මෙම ඉඩමෙන් බෙදා වෙන් කරන ලද අංක 4 දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම පිඹුරේ අංක 1 දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම සහ ඒ තුළ තිබෙන වැව්ලි, ගොඩනැගිලි යනාදී සියලු දෑද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ B520/207 හි ලේඛනගතව ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38, 1/ඒ, පිට්ටනිය පාර,
මාතර.

11-225

---

## මහජන බැංකුව-මොණරාගල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

